# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.01.27 මාධ්‍ය නිවේදන අංක: 2025/008

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>ගොඩනැගිලි සැලැස්මට සහ ඉඩමේ සැලැස්මට අනුමැතිය ලබා දීම සඳහා අල්ලස් ඉල්ලා, ලබාගත් මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිට සහ රියදුරුට එරෙහිව නඩු පවරයි.</u>**

මාවනැල්ල, උතුවන්කන්ද ප්‍රදේශයේ පදිංචි සිවිල් පුද්ගලයෙකු විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරුට අයත් ඉඩමක ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ල සඳහා ගොඩනැගිලි සැලැස්ම හා එම ඉඩමේ සැලැස්ම සඳහා මාවනැල්ල ප්‍රාදේශීය සභාව මගින් අනුමැතිය ලබා දීම සඳහා රු.2,000,000/= (රුපියල් මිලියන දෙකක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා, ලබාගත් මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිට සහ රියදුරුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නඩු පැවරීමක් සිදු කර ඇත.

ඒ අනුව, නඩු අංක HCB/357/2025 යටතේ 2025.01.08 වන දින මෙම පුද්ගලයන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672